සියලු ම හිමිකම් ඇවිරිණි

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අවසාන විභාගය - 2012 ජනවාරි

## (59) කළමනාකරණ ගිණුම්කරණය හා ව්‍යාපාර මූල්‍ය
Management Accounting and Business Finance

**කාලය: පැය 03 යි.**

2012-01-21
පස්වරු
[2.00 - 5.00]

පිටු ගණන : 06
ප්‍රශ්න ගණන : 07

- **අයදුම්කරුවන්ට උපදෙස්:**
  *(1) මෙම ප්‍රශ්න පත්‍රය A හා B යන කොටස් **දෙකෙන් (02)** සමන්විත වේ.*
  *(2) **කොටස් දෙකේ සියලු ම ප්‍රශ්නවලට උත්තර ලිවිය යුතු ය.***
  *(3) අයදුම් කළ **මාධ්‍යයට** අදාළව, **එක් භාෂාවකින්** පමණක්, සපයනු ලබන **පොත්වල** උත්තර ලියන්න.*
  *(4) ගණක යන්ත්‍ර භාවිතයට අවසර දෙනු ලැබේ.*
  *(5) **පෙරවැඩ** සියල්ල ඉදිරිපත් කරන්න. ඔබ විසින් කරනු ලබන **උපකල්පන** කිසිවක් වේ නම්, ඒවා පැහැදිලිව සඳහන් කරන්න.*
  *(6) ලකුණු 100.*

---

## A - කොටස
### කළමනාකරණ ගිණුම්කරණය (ලකුණු 75)

**01.** (A) "පොදු කාර්ය පිරිවැය විභජනය (apportionment) " යන්න "පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණය" යන්නෙන් වෙන්කොට හඳුනා දක්වන්න. (ලකුණු 04)

(B) පිළිවෙලින් **P** සහ **Q** යන අමුද්‍රව්‍ය යොදා ගනිමින් සීමාසහිත **ABC සමාගම, A** සහ **B** යන නිෂ්පාදිත දෙකක් නිපදවයි. **A** සහ **B** නිෂ්පාදිතවල 2011 මාර්තු මාසය සඳහා වූ සෘජු පිරිවැය පහත සඳහන් පරිදි විය.

**A නිෂ්පාදිතය**

| | රු. |
|---|---:|
| **P** අමුද්‍රව්‍ය (මීටර් 5) | 250 |
| ශ්‍රමය (පැය 3) | 75 |
| විචල්‍ය පොදුකාර්ය | 75 |
| **එකතුව** | **400** |

**B නිෂ්පාදිතය**

| | රු. |
|---|---:|
| **Q** අමුද්‍රව්‍ය (මීටර් 3) | 150 |
| ශ්‍රමය (පැය 4) | 100 |
| විචල්‍ය පොදුකාර්ය | 50 |
| **එකතුව** | **300** |

2011 මාර්තු මාසය සඳහා නිෂ්පාදන පොදුකාර්ය රු.511,500/- ක් වූ අතර, එහි විස්තර පහත පරිදි වේ:

| | රු. |
|---|---:|
| විදුලිය | 115,500 |
| ජලය | 15,000 |
| ක්ෂය කිරීම | 93,000 |
| යන්ත්‍ර රක්ෂණය | 46,500 |
| පරිපාලන කාර්ය මණ්ඩලයේ වැටුප් | 230,000 |
| කාර්ය මණ්ඩල සුබසාධනය | 11,500 |
| **එකතුව** | **511,500** |

2011 මාර්තු මාසය සඳහා සමාගමේ පොත් වලින් උපුටා ගත් පහත සඳහන් අතිරේක තොරතුරු ඔබට සපයා දී ඇත.

| **විස්තරය** | **A නිෂ්පාදන දෙපාර්තමේන්තුව** | **B නිෂ්පාදන දෙපාර්තමේන්තුව** | **අංක I සේවා පිරිවැය මධ්‍යස්ථානය** | **අංක II සේවා පිරිවැය මධ්‍යස්ථානය** |
|---|---|---|---|---|
| වක්‍ර සේවකයන් ගණන | 10 | 5 | 4 | 4 |
| යන්ත්‍රයේ වටිනාකම (රු.) | 2,250,000 | 1,750,000 | 500,000 | 150,000 |
| ජලය භාවිතය (රු.) | - | - | 15,000 | - |
| විදුලිය භාවිතය (කිලෝවොට්) | 150 | 90 | 120 | 25 |

අංක I සේවා පිරිවැය මධ්‍යස්ථානයෙහි පොදුකාර්ය පිරිවැය **A** සහ **B** නිෂ්පාදන දෙපාර්තමේන්තු අතර පිළිවෙලින් 3:2 අනුපාතිකයට බෙදා හැරිය යුතුය. අංක II සේවා පිරිවැය මධ්‍යස්ථානයෙහි පොදු කාර්ය පිරිවැය නිෂ්පාදන දෙපාර්තමේන්තු අතර සමානව බෙදා හැරීම කළ යුතුය.

2011 මාර්තු මාසය තුල **A** නිෂ්පාදිතයෙන් ඒකක 1,500 ක්ද, **B** නිෂ්පාදිතයෙන් ඒකක 1,200 ක්ද, සමාගම විසින් නිපදවන ලදී.

**පහත දෑ ඔබ විසින් ගණනය කළ යුතුය,**

(a) නිෂ්පාදිත **A** සහ **B** සඳහා ඒකකයක මුළු පිරිවැය. (ලකුණු 08)

(b) සමාගමේ මිල නියම කිරීමේ ප්‍රතිපත්තිය වන්නේ විකුණුම් මිලෙන් 25% ක ආන්තිකයක් තබා ගැනීම නම්, **B** නිෂ්පාදිතයේ විකුණුම් මිල. (ලකුණු 02)

(මුළු ලකුණු 14)

**02.** (A) පහත සඳහන් පද කෙටියෙන් පැහැදිලි කරන්න.

(a) ගිලුණු පිරිවැය (Sunk Cost).

(b) එකඟ වී ඇති පිරිවැය (Committed Cost).

(c) නාමික පිරිවැය (Notional Cost). (ලකුණු 03)

(B) **සීමාසහිත P සමාගම,** **A** නිෂ්පාදිතය නිපදවා විකුණයි. **A** නිෂ්පාදිතයේ විකුණුම් මිල සහ ඒකක පිරිවැය සංයුතිය පහත සඳහන් පරිදි විය.

| | රු. | රු. |
|---|---|---|
| විකුණුම් මිල | | 160 |
| සෘජු ද්‍රව්‍ය (කිලෝ ග්‍රෑමයක් රු.5/- බැගින්) | 35 | |
| සෘජු ශ්‍රමය (පැයකට රු.9/- බැගින්) | 45 | |
| විචල්‍ය පොදුකාර්ය | 10 | |
| ස්ථාවර පොදුකාර්ය | 40 | |

මුළු ස්ථාවර පොදුකාර්ය පිරිවැය වර්ෂයකට රු.700,000/- කි. 2011 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුල සීමාසහිත **P සමාගම** ඒකක 17,500 ක් නිපදවා විකුණුවේය.

**ඔබ විසින් පහත දෑ ගණනය කළ යුතුය:**

(a) සමච්ඡේදන විකුණුම්, ඒකක වලින්. (ලකුණු 02)

(b) සුරක්ෂිත ආන්තිකය, ඒකක වලින්. (ලකුණු 02)

(c) දායක විකුණුම් අනුපාතය. (ලකුණු 01)

(d) රු.700,000/- ක ලාභයක් ඉපැයීම සඳහා **A** නිෂ්පාදිතයෙන් විකිණිය යුතු ඒකක ගණන. (ලකුණු 02)

(C) **සීමාසහිත PQR සමාගමේ** කළමනාකාරිත්වය ඊළඟ වර්ෂයේ අයවැය ලේඛනය ගැන සලකා බලමින් සිටී. **P** නම් වූ නිෂ්පාදිතයක් සඳහා අයවැය ගත පිරිවැය පහත පරිදි වේ:

| | **රු.** |
|---|---|
| සෘජු ද්‍රව්‍ය | 25 |
| සෘජු ශ්‍රමය | 12 |
| විචල්‍ය පොදුකාර්ය | 8 |
| ස්ථාවර පොදුකාර්ය | 6 |
| **මුළු පිරිවැය** | **51** |

මෙම නිෂ්පාදිතයේ ඒකක 14,000 ක් ඊළඟ වර්ෂයේ නිපදවීමට **සීමාසහිත PQR සමාගම** අපේක්ෂා කරයි. මෙම නිෂ්පාදිතයම නිපදවන, **සීමාසහිත ABC සමාගම** නම් වූ වෙනත් සමාගමක්, ඒකකයක් රු.45/- බැගින් සැපයීමට එකඟ වී තිබේ. **සීමාසහිත ABC සමාගමෙන්** මෙම නිෂ්පාදිතය මිලදී ගන්නේ නම්, **සීමාසහිත PQR සමාගමට** තම කර්මාන්ත පරිශ්‍රය වර්ෂයකට රු.140,000/- බැගින් වූ මුදලකට වෙනත් සමාගමට කුලියට දිය හැක.

**ඔබ විසින්:**

(a) **සීමාසහිත ABC සමාගම** කර ඇති පිරිනැමීම පිළිගත යුතුද, නැතහොත් **P** නිෂ්පාදිතය නිපදවීම කළ යුතු දැයි යන්න නිගමනය කරන්න. (ලකුණු 03)

(b) **සීමාසහිත ABC සමාගම** විසින් මිල වැඩි කිරීමේ ප්‍රවණතාවක් ඇති වුවහොත්, **P** නිෂ්පාදිතය සඳහා **සීමාසහිත PQR සමාගම** විසින් ගෙවීමට එකඟ විය හැකි උපරිම මිල ගණනය කළ යුතුය. (ලකුණු 03)

(c) ඉහත (a) සඳහා උත්තරය ලබා ගැනීමේදී ඔබ විසින් සලකා බැලිය යුතු අතිරේක කරුණු තුනක්(03) ලැයිස්තුගත කළ යුතුය. (ලකුණු 03)

(මුළු ලකුණු 19)

**03.** (A) අයවැය කමිටුවක අයවැය නිලධාරියාගේ කාර්යයන් මොනවාද? (ලකුණු 03)

(B) 2012 මාර්තු 31දිනෙන් අවසන් වන කාර්තුව සඳහා **සීමාසහිත Z සමාගමේ** වාර්ෂික අයවැයෙන් උපුටා ගත් තොරතුරු පහත දැක්වේ:

(1) ඇස්තමේන්තු කළ විකුණුම්:

| **මාසය** | **ඒකක** | **ඒකකයක මිල (රු.)** |
|---|---|---|
| ජනවාරි | 38 | 225,000 |
| පෙබරවාරි | 41 | 226,000 |
| මාර්තු | 39 | 227,000 |

(2) ඒකකයක විචල්‍ය නිෂ්පාදන පිරිවැය පහත සඳහන් පරිදි වේ:

| | **රු.** |
|---|---|
| සෘජු ද්‍රව්‍ය | 65,000 |
| සෘජු ශ්‍රමය | 35,000 |
| විචල්‍ය පොදු කාර්ය | 45,000 |

(3) ස්ථාවර නිෂ්පාදන පොදුකාර්ය මසකට රු.2,000,000/- ක් වන අතර, එහි වත්කම් ක්ෂය සඳහා වූ රු.500,000/- ක් ඇතුලත්ය. ස්ථාවර නිෂ්පාදන පොදුකාර්ය වියදම් එම මාසයේම ගෙවිය යුතුය.

(4) 2011 දෙසැම්බර් 31 දිනට ණයහිමියන්ට නොපියවූ ශේෂය රු.1,800,000/- ක් වන අතර එහි ඇතුලත් වන්නේ 2011 දෙසැම්බර් මාසය තුළ කළ අමුද්‍රව්‍ය මිලයට ගැනීම්ය. සමාගමේ අමුද්‍රව්‍ය මිලයට ගැනීම් වලින් 60% ක් ණය පදනම මත වන අතර, එය ඊළඟ මාසයේ පියවා දැමිය යුතු විය.

(5) සෘජු ශ්‍රමය සහ විචල්‍ය පොදුකාර්ය සඳහා එම මාසයේම ගෙවිය යුතුය.

(6) 2012 ජනවාරි 01 දිනට බැංකු අයිරා ශේෂය රු.1,800,000/- කි.

(7) විකුණුම් වලින් 40% ක් ණය පදනම මත වූ අතර, එම ණයට විකුණුම් ඊලඟ මාසයේ නිරවුල් කළ යුතුය. 2011 දෙසැම්බර් 31 දිනට ණයගැතියන් කිසිවකු නොවීය.

(8) 2012 ජනවාරි මාසයේ රු.6,000,000/- ක බැංකු ණයක් ලබා ගැනීමට සමාගම සැලසුම් කර ඇති අතර 2012 පෙබරවාරි මාසයෙන් ආරම්භ වී, අවුරුදු 5 ක කාලයක් තුළ, රු.150,000/- බැගින් වූ ස්ථාවර මාසික වාරික මගින් මෙම ණය පියවා දැමිය යුතුය.

(9) නිපදවන ඒකක එම මාසයේදීම විකුණනු ලැබේයැයි උපකල්පනය කරන්න.

**ඔබ විසින්,** 2012 පළමු කාර්තුව සඳහා, මාසික පදනම අනුව මුදල් අයවැයක් පිළියෙල කළ යුතුය.

(ලකුණු 10)

(මුළු ලකුණු 13)

**04.** (A) පෙරසැරි පිරිවැයකරණයේ යෙදෙන පහත සඳහන් පද කෙටියෙන් පැහැදිලි කරන්න.

(i) සාමාන්‍ය අපතය.

(ii) අසාමාන්‍ය අපතය. (ලකුණු 02)

(B) **ඇල්ෆා, බීටා** සහ **තීටා** යන අමුද්‍රව්‍ය තුන යොදා ගනිමින් **"ක්වොලිටි ප්‍රොඩක්ට්ස්"** සමාගම පවිත්‍ර කාරකයක් නිපදවයි. මෙම අමුද්‍රව්‍ය පහත සඳහන් මිල ගණන් වලට සැපයුම්කරුවන්ගෙන් ලබා ගැනීමට සමාගම කොන්ත්‍රාත් වලට බැඳී ඇත.

**ඇල්ෆා** - කිලෝග්‍රැමයක් රු.192/- බැගිනි.

**බීටා** - කිලෝග්‍රැමයක් රු.120/- බැගිනි.

**තීටා** - කිලෝග්‍රැමයක් රු.96/- බැගිනි.

මාසය ආරම්භයේදී නොනිමි වැඩ කිසිවක් නොතිබුණ අතර, නොවැම්බර් මාසය තුළ පෙරසැරියට අමුද්‍රව්‍ය යෙදවුම් පහත පරිදි විය:

**ඇල්ෆා** - කිලෝග්‍රෑම් 3,200.

**බීටා** - කිලෝග්‍රෑම් 4,800.

**තීටා** - කිලෝග්‍රෑම් 9,600.

මාසයකට දින 24 ක් සමාගමේ වැඩ කෙරෙන අතර, ශ්‍රමිකයෙකුට දිනකට රු.941/- බැගින් ගෙවනු ලැබේ. නොවැම්බර් මාසය තුළ පෙරසැරියේ වැඩ කිරීමට ශ්‍රමිකයන් 40 දෙනෙකු වෙන්කර තිබුණි. ශ්‍රම පිරිවැයෙන් 50% ක් පදනම් කොට නිෂ්පාදන පොදුකාර්ය අයකරනු ලැබේ. නිමැවුම කිලෝ ග්‍රෑම් 13,760 කි. පෙරසැරියේ අපතයන් නොවූ ලෙස උපකල්පනය කරන්න.

මාසය අවසානයේ නොනිමි වැඩ පහත පරිදි නිම වී ඇත:

- ද්‍රව්‍ය 100%
- ශ්‍රමය සහ පොදුකාර්ය - නොනිමි වැඩ වලින් $\frac{1}{4}$ ක් 60% ක් සම්පූර්ණ වූ අතර, ඉතිරිය 25% ක් සම්පූර්ණ ය.

**ඔබ විසින් පහත ඇ පිළියෙල කළ යුතුය,**

(i) නිෂ්පාදන පිරිවැය ඇගයීම් ප්‍රකාශය.

(ii) පෙරසැරි ගිණුම. (ලකුණු 13)

(මුළු ලකුණු 15)

**05.** ප්‍රමිත පිරිවැයකරණ ක්‍රමය අනුගමනය කරන **"විම්බල්ඩන් ස්පෝර්ට්ස් සමාගම"** ටෙනිස් පිති නිෂ්පාදනයට භාවිත කෙරෙන ගුණාත්මක බවින් උසස් උපාංගයක් නිපදවයි. 2011 නොවැම්බර් මාසයේ අයවැය ගත කල නිෂ්පාදනය / විකුණුම් ප්‍රමාණය, එක් උපාංගයක් රු.178/- බැගින් උපාංග 19,000 ක් වූ අතර, ප්‍රමිත පිරිවැය පත්‍රිකාව පහත පරිදි වේ:

| | රු. |
|---|---|
| ද්‍රව්‍ය (ඝන සෙන්ටිමීටරයක් රු.10/- බැගින් ඝන සෙන්ටිමීටර 2) | 20 |
| ශ්‍රමය (පැයකට රු.24/- බැගින් පැය 3) | 72 |
| විචල්‍ය පොදුකාර්ය (ශ්‍රම පැයකට රු.8/- බැගින්) | 24 |
| ස්ථාවර පොදුකාර්ය (ශ්‍රම පැයකට රු.6/- බැගින්) | 18 |
| **මුළු පිරිවැය** | **134** |

2011 නොවැම්බර් මස රු.392,000/- ක පිරිවැයකට ද්‍රව්‍ය ඝන සෙන්ටිමීටර් 40,000 ක් මිලයට ගත් අතර, උපාංග 19,200 ක් නිපදවන ලදි. කාලසීමාව ආරම්භයේදී හා අවසානයේදී ද්‍රව්‍ය තොග ශේෂ තබා ගැනීමක් සිදු නොකෙරේ. පැය 62,000 ක් සඳහා ශ්‍රමිකයන්ට රු.1,388,000/- ක් ගෙවන ලද නමුත් ඔවුන් සත්‍ය වශයෙන් වැඩ කර ඇත්තේ පැය 61,500 ක් පමණි. විචල්‍ය පොදුකාර්ය ලෙස රු.576,000/- ක් වියදම් දරා ඇත. කාල සීමාව සඳහා අයවැයගත කළ ස්ථාවර පොදු කාර්ය රු.342,000/- ක් වූ අතර, තථ්‍ය ස්ථාවර පිරිවැය රු.361,000/- ක් විය.

විකුණුම් මට්ටම් ආරක්ෂා කිරීම සඳහා විකුණුම් මිල රු.130/- ට අඩු කරන ලද නමුත්, උපාංග 18,000 ක් පමණක් විකුණාගත හැකි විය.

**ඔබ විසින්,** පහත සඳහන් විචලනයන් ගණනය කළ යුතුය,

(a) විකුණුම් මිල සහ පරිමා.

(b) සෘජු ද්‍රව්‍ය මිල සහ භාවිත.

(c) සෘජු ශ්‍රම අනුපාතික, කාර්යක්ෂමතා සහ අක්‍රියකාල.

(d) විචල්‍ය පොදුකාර්ය වියදම් සහ කාර්යක්ෂමතා.

(e) ස්ථාවර පොදුකාර්ය වියදම්, පරිමා සහ කාර්යක්ෂමතා. (ලකුණු 14)

## B - කොටස

### ව්‍යාපාර මූල්‍ය (ලකුණු 25)

**06.** (A) ප්‍රාග්ධන පිරිවැය ගණනය කිරීම සඳහා භාවිත කෙරෙන ලාභාංශ වර්ධන ආකෘතියේ සීමාවන් දෙකක්(02) ලැයිස්තුගත කරන්න. (ලකුණු 02)

(B) **සීමාසහිත රූපී පොදු සමාගමේ** පහත සඳහන් තොරතුරු ඔබට දෙනු ලැබේ.

| | රු.'000 |
|---|---|
| ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස් (කොටසක් රු.10/- බැගින්) | 100,000 |
| 15% ණයකර (අවුරුදු 5 කින් කල් පිරෙන) | 25,000 |

- සාමාන්‍ය කොටසක වර්තමාන වෙළෙඳපොළ මිල රු.25/- කි. පසුගිය වසරේ කොටසකට රු.2/- බැගින් වූ ලාභාංශයක් සමාගම විසින් ගෙවන ලදි. එය වාර්ෂිකව 5% බැගින් වර්ධනය වනු ඇතැයි අපේක්ෂිතය.
- රු.100/- ණයකරයක් වෙළෙඳපොළෙහි රු.95/- බැගින් විකිණේ.
- බදු නොසලකා හරින්න.

**ඔබ විසින් පහත ඇ ගණනය කළ යුතුය,**

(a) ස්කන්ධ ප්‍රාග්ධන පිරිවැය. (ලකුණු 02)

(b) ණය පිරිවැය. (ලකුණු 03)

(c) වෙළෙඳපොළ වටිනාකම මත පදනම් වූ බර තැබූ සාමාන්‍ය ප්‍රාග්ධන පිරිවැය. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

**07.** වෙළෙඳපොළෙහි ඉදිරි වර්ෂ 5කට ඉල්ලුමක් පවතිනු ඇතැයි අපේක්ෂිත ඇසුරුම් කළ ආහාර අයිතමයක් හඳුන්වා දීමට **"වටිනි ෆුඩ් ප්‍රොඩක්ට්ස් සමාගම"** සැලසුම් කරමින් සිටී. ව්‍යාපෘතිය සඳහා පහත දැක්වෙන ඇස්තමේන්තුව කළමනාකරණ ගණකාධිකාරී විසින් සකස් කර තිබේ.

**නව ඇසුරුම් කළ ආහාර ව්‍යාපෘතිය**

*(සියළුම වටිනාකම් රු.'000 වලින්)*

| වර්ෂය → | 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|---|
| **ආදායම්:** විකුණුම් | 700 | 980 | 1,064 | 1,148 | 1,064 |
| **වියදම්:** | | | | | |
| ද්‍රව්‍ය | 107 | 150 | 180 | 210 | 180 |
| ශ්‍රමය | 214 | 300 | 360 | 420 | 360 |
| නිෂ්පාදන පොදුකාර්ය | 100 | 200 | 200 | 250 | 250 |
| වෙනත් සෘජු වියදම් | 90 | 80 | 70 | 60 | 50 |
| ක්ෂය | 180 | 180 | 180 | 180 | 180 |

(1) අළුත් යන්ත්‍රයක් සඳහා රු.900,000/- ක් ආයෝජනය කිරීමට සමාගම අපේක්ෂා කරන අතර එය වහාම ගෙවිය යුතුව ඇත.

(2) යන්ත්‍ර අවුරුදු 5 ක් භාවිත කළ හැකි අතර අවශේෂ වටිනාකමකින් (residual value) තොරය.

(3) නිෂ්පාදන පොදුකාර්ය වලින් 40% ක් ප්‍රධාන කාර්යාලයෙන් දරනු ලබන පොදු පිරිවැය නියෝජනය කරමින් වෙන් කෙරෙන අතර, ඉතිරි 60% අළුත් නිෂ්පාදිතය මත වර්ධනය වනු ඇත. (incremental upon the new product).

(4) සමාගමේ ප්‍රාග්ධන පිරිවැය 12% කි.

(5) පසුගිය වසරේ මෙම නිෂ්පාදිතය වෙනුවෙන් සක්‍යතා අධ්‍යයනයක් කරන ලදී. සක්‍යතා අධ්‍යයනයේ පිරිවැය රු.25,000/- ක් වූ අතර, එය පළමුවන අවුරුද්දෙහි (year 1) වෙනත් සෘජු වියදම් වලට ඇතුලත් කර ඇත.

(6) බදු ගැන නොසලකා හරින්න.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) අවුරුදු 1 සිට 5 දක්වා ශුද්ධ මුදල් ප්‍රවාහයන් ගණනය කරන්න. (ලකුණු 06)

(b) ශුද්ධ වර්තමාන අගය ගණනය කොට, ඇසුරුම් කළ අළුත් ආහාර අයිතමය නිපදවීම සමාගම කළ යුතු දැයි තීරණය කරන්න. (ලකුණු 03)

(c) පිළිගෙවුම් කාලය (pay-back period) ගණනය කරන්න. (ලකුණු 03)

(d) ව්‍යාපෘති ඇගයීමේ නිර්ණායකයක් ලෙස "පිළිගෙවුම් කාලය" ක්‍රමයෙහි අඩු පාඩු (drawbacks) මොනවාද? (ලකුණු 03)

(මුළු ලකුණු 15)

12% බැගින් වට්ටම් සාධකය මෙසේය:

| අවුරුද්ද | වට්ටම් සාධකය |
|---|---|
| 1 | .893 |
| 2 | .797 |
| 3 | .712 |
| 4 | .636 |
| 5 | .567 |
| 6 | .507 |

- o0o -